දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

නැටුම් (දේශිය) I,II
நடனம் (சுNjச) I,II
Dancing (Oriental) I,II

නැටුම් (දේශිය) I,II

**I I කොටස**

**(1)**

(1) ශාන්ති දේව් ඝෝෂ් මහතා විසින් 1936 දී නිර්මාණය කරන ලද ....................................... මුද්‍රා නාට්‍යය මෙරට නිෂ්පාදනය ලද ප්‍රථම මුද්‍රා නාට්‍යයයි.

(2) කතකලි නර්තනය උගන්වන ප්‍රධාන අධ්‍යාපන ආයතනය ..........................වේ.

(3) "පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම " යන කවි පදය .....................................ගායනයට අයත් වේ.

(4) දෙසුළු ................තුන් තිතේ තාල රූපය 2 + 2 + 4 ලෙස දක්වයි.

(5) පහතරට සින්දු වන්නම් ............................... දෙවියන්ගේ ගුණ ගායනය අරමුණු කර නිර්මාණය වී ඇත.

(6) දෙපනෝ ............................. නාට්‍ය වර්ගයට අයත් වේ.

(7) කරදිය මුද්‍රා නාට්‍යයෙහි පසුතල නිර්මාණය හා රංගවස්ත්‍ර නිර්මාණය ............................... ශිල්පියා විසින් සිදුකර ඇත.

(8) මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් 1980 දී ...................................නැටුම වේදිකාවට හඳුන්වා දෙන ලදී.

(9) ජස කෝලම හා සම්බන්ධ කාන්තා චරිත වන්නේ, (අ)............................... සහ (ආ) ……..........................................ය.

(10)පහත සඳහන් භාවයන් තුළින් උපදින රස නම් කරන්න.
(අ ) විස්ම - ...................................... (ආ ) උත්සාහ - ............................................

**(2)** පහත දැක්වෙන බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.

i. "දො දොංත තකු දොං"

"රෙගුද ගතකු දොම්"

"ජිමිතකු දා දොම්"

ii. පහත දැක්වෙන කවි පදය මාත්‍රා තුනේ (3+3) තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"පුරවර මැද බැඳි රන් ඔංචිල්ලා........."

iii. මාත්‍රා 3+4 තාලයට අයත් අඩව්වක් හෝ මාත්‍රා 2+2+3 තාලයට අයත් ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

**(3)** පහත දැක්වෙන මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ද්‍රවිඩ ගැමි නැටුම්

ii. ප්‍රස්තාරකරණය

iii. කඩතුරා කවි

iv. පංච තූර්ය වාදනය

v. සතර අභිනය

**(4)** දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ශාන්ති කර්ම තුළ සුවිශේෂී ලක්ෂණ හඳුනා ගත හැකිය.

i. ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු දෙකක් හඳුන්වන්න.

ii. කොහොඹාකංකාරිය, දෙවොල්මඩුව සහ පහන්මඩුව යන ශාන්ති කර්මවල භාවිත ප්‍රධාන ඇඳුම් කට්ටල පිළිබඳ ව කෙටියෙන් පැහැදිළි කරන්න.

iii. දෙවොල් මඩුව ශාන්තිකර්මයෙහි කතා පුවත මඟින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න.

**(5)** ගැමි නැටුම් සහ ගැමි නාටක තුළින් විවිධ වූ ශ්‍රී ලාංකීය ජන ජීවන තොරතුරු හෙළිදරව් වේ.

i. සොකරි ගැමි නාටකයේ පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා එහි රඟමඩල කෙටියෙන් හඳුන්වන්න.

ii. ගැමි නැටුම් හා බැඳි ගායනා තුළින් පිළිබිඹුවන සමාජ සහජීවනය පිළිබඳ ව නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

iii. ගැමි නැටුම්වල දීර්ඝ ඉතිහාසයක් ඇති බව ඔබ උගත් රූකමක් හෝ දේශාටන වාර්තාවක් ඇසුරින් සනාථ කරන්න.

**(6)** පහත දැක්වෙන රූපරාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
|  |  |  |

i. මෝගල් රාජ සමයේ සංවර්ධනය වූ නර්තන සම්ප්‍රදාය ඉහත ඡායාරූප තුළින් තෝරා නම් කර, එහි සංගීතය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

ii. A රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එහි ඉණට,ගෙලට හා නළලට පළඳින ආභරණ කොටස් තුනක් හඳුන්වන්න.

ii. ඊශානදිග භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය ඇතුළත් රූපය තෝරා එම සම්ප්‍රදාය හා බැඳි ආගමික පසුබිම විස්තර කරන්න.

**(7)** 21 වන සියවස වන විට සාම්ප්‍රදායික නර්තන කලාවේ නව ප්‍රවණතා දැකගත හැකිය.

i. “ රංග වස්ත්‍ර නිර්මාණකරණය"

ii. “සමාජයීය අවශ්‍යතාවයන්ට අනුව නර්තනය යොදා ගැනීම"

iii. "ප්‍රාසාංගික බව වර්ධනය කිරීමට තාක්ෂණය භාවිතය"

යන ශීර්ෂ ඔස්සේ ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

******